**ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

-------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.1 හි ඇතුළත් අදායම් සංකේතයට අදාළ ආදායම් ගිණුමක්ද ආරක්ෂක අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ආදායම් ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

-------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 රෙගුලාසිය ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

------------------------

ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වනු ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.3.1 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.13 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. විසදා නොතිබුණු විගණන ඡේද | 2.7 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.14 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.1.2 |
| | | 2. දේශීය අරමුදල් ව්‍යාපෘති වල කාර්යසාධනය | 2.2 (අ) |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.2 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වත්කම් ලේඛනගත කිරීම | 2.4 (ආ)<br>2.4.(ඉ) |
| | | 2. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.4.(ඇ) |
| | | 3. මූල්‍ය හා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.4.(ඈ) |
| | | 4. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | 2.4.(ඊ) |

| | | | | |
|---|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | 1. | වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම | 2.1.3 |
| | | 2. | බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ අඩුපාඩු | 2.5.(අ) |
| | | 3. | අනුමත සීමාව ඉක්මවා බැරකම් වලට එළඹීම | 2.5.(ආ) |
| | | 4. | පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.11 |
| | | 5. | බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු | 2.12 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.8.(අ) |
| | | 2. | අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.8.(ආ) |
| | | 3. | මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් උපයෝජනය කරගෙන නොතිබීම | 2.8.(ඇ) |
| | | 4. | ප්‍රතිපාදන උපයෝජනය නොකර වෙනත් වැය වියෂයකට මාරුකිරීම | 2.8.(ඈ) |
| | | 5. | වෙනත් අමාත්‍යාංශ විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය | 2.8.(ඉ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | 1. | ආදායම් ගිණුම්වල අඩුපාඩු | 2.9 |
| | | 2. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.10 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා | 1. | පාඩු හා හානි | 2.6 |
| | | 2. | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.15 |

වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කාර්යසාධනය

-----------------

#### 2.1.1 සැලැසුම් කිරීම

-----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 14 ක් පැවැති අතර, අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන 14 ක් හා අරමුදල් 01 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පෞද්ගලික ආරක්ෂක සේවා නියාමනය හා ගිණි අවි සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධ පාලන කටයුතු යන අරමුණු ඉටු කිරීමට අදාලව කාර්යයන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි. ඒ අනුව සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සැලසුම් කළ යුතු කාර්යයන් වූ ආරක්ෂක නිලධාරීන් පුහුණු කිරීම පිළිබඳ නීතිමය රාමුව සකස්කිරීම, 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත සංශෝධනය කර ඒ යටතේ ස්වයං ආරක්ෂක සේවා පවත්වාගෙන යනු ලබන ආයතන නියාමනය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම සහ 1996 අංක 22 දරන ගිනිඅවි (සංශෝධිත) පනත යටතේ අයකරනු ලබන ගාස්තු සංශෝධනය යන කාර්යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ සිවිල් ආරක්ෂක අංශය, ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය, උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතිය, රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතිය හා ජාතික ශිෂ්‍යභට බලකායට අදාලව සමාලෝචිත වර්ෂයට අදාළව වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුම, ක්‍රියාත්මක කළ යුතු කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ අංශ 06 ක ඉටුකළ යුතු කාර්යභාරයන්ට අදාල අයවැය ඇස්තමේන්තු හා මූල්‍ය ඉලක්කයන් දක්වා නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මේ අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත අරමුදලක් වූ අපි වෙනුවෙන් අපි අරමුදල යටතේ වූ කාර්යයන් ඇතුළත්ව නොතිබුණි.

**2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**--------------------------------**

මේ සම්බන්ධව නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය**

**------------------------------------------------------------**

ත්‍රිවිධ හමුදා අතර කලාපය තුළ පවතින නවීන සන්නිවේදන පද්ධතියට සමාන අයුරින් අඛණ්ඩ ආරක්ෂාකාරී හා විකල්ප සන්නිවේදන ජාලයක් සැපයීම අරමුණු කර ගෙන තෝරාගත් දිවයිනේ ස්ථාන 22 ක ස්වයං ආධාරක සන්නිවේදන කුළුණු 22 ඉදිකිරීම, විදුලි උත්පාදන යන්ත්‍ර 22 සපයා සවිකිරීම, ක්ෂුද්‍ර තරංග සබඳතා 37 ක් හා ජාල කළමනාකරණ පද්ධතියකින් සමන්විත පොදු සන්නිවේදන මූලාධාරකයක් ස්ථාපනය කිරීම යන කටයුතු මේ යටතේ නිමකිරීමට බලාපොරොත්තු විය.
මේ සම්බන්ධව නිරීක්ෂණ පහත දැක්වේ.

(i) ප්‍රසම්පාදන කමිටු රැස්වීම් කල් දැමීමට සිදුවී තිබීම, සිවිල් ගුවන් සේවා අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය ආදී ආයතන වෙතින් කුළුණු ස්ථානගත කළ යුතු ස්ථානවලට අදාල විශේෂ අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදය සහ විදුලි උත්පාදන යන්ත්‍ර සඳහා ආවරණ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම හා ගුවන් විදුලි ප්‍රතියෝජක පද්ධතියේ ප්‍රසම්පාදන කටයුතු යලි කැඳවීමට සිදුවී තිබීම ආදී ගැටළු ව්‍යාපෘති කාර්ය සාධනය පහල මට්ටමක පැවැතීමට හේතුන් ලෙස ප්‍රගති වාර්තාවල දක්වා තිබුණි.

**(ii)** 2013 වර්ෂයේදී අනුමත කර තිබුණු රු.මිලියන 1,192 ක ව්‍යාපෘති ඇස්තමේන්තුවක් මත 2014 සිට 2016 දක්වා වන මධ්‍ය කාලීන වියදම් රාමුව යටතේ කාර්යයන් නිමකිරීමට සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 60 වැය කර තිබූ අතර, ව්‍යාපෘති කාලය අවස්ථා දෙකක දී දීර්ඝ කර ගෙන තිබුණි.

(iii) පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 865.8 ක් වූ ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සබඳතා 37 ක් සමඟ ජාල කළමනාකරණ පද්ධතිය සැපයීමේ ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය වන තෙක් අවසන් වී නොතිබුණි.

**(ආ) ආරක්ෂක හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය**

**------------------------------------------------------**

ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණයක්, සන්නිවේදන ගොඩනැගිල්ලක්, ආරක්ෂක ගොඩනැගිල්ලක්, මලාප්‍රවාහන පද්ධතියක් හා ජල පොම්පාගාරයක් අදියර I යටතේ හා ත්‍රිවිධ හමුදා නිලධාරීන් 500 ක් හා නේවාසික සෙසු නිලයන් 6,100 ක් සඳහා භෝජනාගාර හා අනෙකුත් භාහිර අංගයන් ඇතුළු ස්ථිර වාසස්ථාන සැපයීම අදියර II යටතේත් ප්‍රමුඛතා පදනමින් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මේ සඳහා සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 55,602.92 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට දරා තිබුණු මුළු ව්‍යාපෘති වියදම රු.මිලියන 19,004 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය හා පසුගිය වසර 02 ක අයවැය ප්‍රතිපාදන උපයෝජනය පහළ මට්ටමක පැවැතිණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | උපයෝජනය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| 2015 | 7,980 | 1,763 | 6,217 | 22.04 |
| 2016 | 5,996 | 2,893 | 3,103 | 48.04 |
| 2017 | 3,922 | 2,084 | 1,838 | 53.16 |

(ii) පරීක්ෂා කරන ලද කොන්ත්‍රාත් කාර්යයන් 18 ක නියැදියට අදාලව ප්‍රසම්පාදන කටයුතුවල සහ සැපයුම් හා සවිකිරීම් කාර්යයන් හි ඇතිවී තිබූ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල අපේක්ෂා කර තිබූ මූල්‍ය හා භෞතික කාර්යසාධනයට ලඟා වීමට නොහැකි වී තිබුණි. එම ප්‍රමාද වීම් දින 206 සිට 922 ක් දක්වා කාල පරාසයක පැවැතුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු විසින් කාලය දීර්ඝ කිරීමේ පිරිවැය වැඩිවීම් සඳහා රු.මිලියන 486.64 ක් අතිරේක ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි.

(iv) ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ගාලු මුවදොර ප්‍රදේශයෙන් ඉවත් කිරීමෙන් පසු එම ගොඩනැගිල්ල තුළ පිහිටි ශ්‍රී ලංකා යුධ හමුදාවේ විවිධ කාර්යාල කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශවල පිහිටි රාජ්‍ය හා පෞද්ගලික අංශවලට අයත් ගොඩනැගිලිවල ස්ථාපිත කර තිබුණි. එම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන 10 කින් වර්ග අඩි 555,036 ක ගොඩනැගිලි බිම් ප්‍රමාණයක් කුලියට ගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් රු.මිලියන 1,293 ක කුලී වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන නොසළකා තරඟකාරී ලංසු කැඳවීමකින් බැහැරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2011 වර්ෂයේ සිට වාස්තු විද්‍යා උපදේශක කටයුතු කළ පෞද්ගලික සමාගම දුර්වල කාර්යසාධනය හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් 2016 ජූනි 29 දින සේවය අවසන් කර තිබුණි. අදාල සමාගම සමඟ ලිඛිත ගිවිසුම්වලට එළඹී නොතිබූ අතර පසුව පත්කල කමිටු වාර්තා මගින් ආපසු අයකර ගැනීමට නිර්දේශ කර තිබූ රු.මිලියන 158.30 මුදල 2017 දෙසැම්බර් 31 දක්වාත් අයකර නොතිබුණි. තවද එම කාර්යයද ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශකවරුන් වන මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට පවරා තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(vi) ඉංජිනේරු උපදේශක සේවය සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය වෙතින් රු.මිලියන 1,556 කට කොන්ත්‍රාත් වටිනාකමකට 2011 වර්ෂයේ සිට වර්ෂ 05 ක කාලයක් සඳහා 2014 වර්ෂයේදී ගිවිසගෙන තිබූ අතර 2016 ඔක්තෝබර් 30 දින ගිවිසුම් කාලය අවසන් වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ගිවිසුම් කාලය දීර්ඝ කිරීමකින් තොරව උපදේශක සේවා ලබාගනිමින් පැවැතුණි. එදිනට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 39 ක් වුවද උපදේශක ගාස්තුවෙන් රු.මිලියන 1,136.57 හෙවත් සියයට 73 ක් පියවා තිබුණි.

(vii) ගොඩනැගිලි 06, 07 හි ඇලුමිනියම් ජනෙල් පද්ධතියක් නිර්මාණය කර සපයා සවි කිරීමේ කොන්ත්‍රාත්තුවේ අගුලු වල නිෂ්පාදන දෝෂ හේතුවෙන් ජනෙල් අගුලු කැඩී යාම 2017 දෙසැම්බර් 31 දක්වාත් නිවැරදි කර නොතිබුණි. 2016 ජනවාරි නිම විය

යුතු ගොඩනැගිලි 06, 07 හි විදුලි සෝපාන පද්ධතියේ කොන්ත්‍රාත්තුව නිම වී නොතිබුණු අතර 2014 දෙසැම්බර් 03 දින ප්‍රදානය කර තිබූ ගොඩනැගිලි 08 හි විදුලි සෝපාන පද්ධතිය සවිකිරීම් කටයුතු ප්‍රාථමික අදියරේ පැවැතිණි.

(viii) ගොඩනැගිලිවල මධ්‍යම වෝල්ටීයතා විදුලි බෙදාහැරීම් පද්ධතිය සම්බන්ධ කොන්ත්‍රාතුවේ කටයුතු සම්බන්ධයෙන් වූ ප්‍රමාදය හේතුවෙන් උපකරණවල වගකීම් කාලය දීර්ඝ කිරීමට රු.මිලියන 38.12 ක අතිරේක මූල්‍ය වගකීමක් පැනනැගී තිබුණි.

(ix) 2014 ඔක්තොම්බර් 27 දින ගිවිසගෙන 2015 වර්ෂයේ නිමකල යුතු අංක 06, 07 ගොඩනැගිලිවල ගිනි ආරක්ෂණ පද්ධතිය සවිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රගතිය පහළ මට්ටමක විය. සිවිලිම ඉදිකිරීම හා පොදු ප්‍රදේශවල ටයිල් ඇතිරීම, නාන කාමර / වැසිකිලි ටයිල් ඇතිරීම, උපාංග සවි කිරීම, රටා සහිත දැවමය වහල යනාදී ප්‍රධාන ප්‍රසම්පාදන කාර්යයන්වල ඇස්තමේන්තු තාක්ෂණික පිරිවිතර සැකසීම, අභියාචනා මත නැවත කැඳවීම, ප්‍රසම්පාදන අනුමැතිය දීමේ ප්‍රමාදයන් හා සම්බන්ධීකරණ සැලැසුම් පිළියෙල කිරීමේ ප්‍රමාදය ආදී ගැටළු හේතුවෙන් යාන්ත්‍රික, ඉංජිනේරු, ජලනල, තොරතුරු තාක්ෂණකටයුතුවල ප්‍රගතිය අඩාල වී තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 47 ක් විය.

**(ඇ) පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල බත්තරමුල්ල**

බත්තරමුල්ල පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී ආරක්ෂක අමාත්‍යාංශය විසින් දේශිය මූලාශ්‍ර වලින් රු.මිලියන 7,550 ක ණය මුදලක් අනුමත කර ගෙන තිබුණි. උපයෝජනය කර තිබුණු ණය මුදල වූ රු.මිලියන 7,512.25 ක් හා ප්‍රාග්ධනිත කල පොළී මුදල වූ රු.මිලියන 1,272.37 ද ඇතුළත්ව 2017 ජූලි 14 දින වන විට බැංකු මඟින් ලබාගෙන තිබූ ණය මුදල රු.මිලියන 8,784.62 ක් විය. මෙම ණය මුදල 2030 අගෝස්තු දක්වා අර්ධ වාර්ෂිකව වාරික වලින් පියවිය යුතුව තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු ණය ශේෂය ලෙස රු.මිලියන 7,395.95 ක් විසර්ජන ගිණුමේ බැරකම් යටතේ දක්වා තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අයවැය ප්‍රතිපාදන මත ණය හා පොළී ගෙවීමට ප්‍රතිපාදන ලබා දෙමින් පැවැති අතර දේශිය ණය ගැනීම්වලට අදාල සම්මත වැය විෂය සංකේතකරණයට අනුව සමාලෝචිත වර්ෂයට අදාල රු.මිලියන 949.70 ක් වූ පොළී ගෙවීම්, වැය විෂය 1601 යටතේද රු.මිලියන 563.32 වූ ණයවාරික ගෙවීම්, වැය විෂය 3001 යටතේද පෙන්විය යුතු වුවද 2017 වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා ගිණුම් තැබීම සඳහා වැය විෂය අංක 1409 යටතේ පොළී ගෙවීමටත් වැය විෂය අංක 2104 යටතේ ණය වාරික ගෙවීමටත් භාවිතා කර තිබුණි.

(ii) මූලික ණය මුදල වූ රු.මිලියන 7,550 රජයේ ණය ලේඛනයට ඇතුළත් කිරීමට 2017 මාර්තු 28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණු නමුත්, ආපසු ගෙවීමේ සහන කාලය තුළ ප්‍රාග්ධනිත කරන ලද රු.මිලියන 1,272.37 වූ ණය පොළිය ගැලපීම් කිරීම සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන නොතිබුණි.

(iii) 2015 අගෝස්තු සිට පොළී ගෙවමින් පැවැති අතර 2016 ජනවාරි මස සිට 2017 දෙසැම්බර් 31 දක්වා ගණනය කරන ලද සාමාන්‍ය බර තැබූ පුමුඛ ණය ගැනීමේ අනුපාතය සියයට 8.9 ක් වුවද, තථ්‍ය පොළී අනුපාතය සියයට 8.5 සිට සියයට 13.12 දක්වා පරාසයක පැවතුණි.

(iv) 2016 වසරේ සිට රාජ්‍ය ආයතන 06 කට කුලී ගිවිසුමකින් තොරව කුලියට ලබාදී තිබුණු අතර ඉහත ආයතන 02 ක් විසින් විධිමත් අනුමැතියකින් තොරව ලබාගෙන තිබූ විදුලි සැපයුම හේතුවෙන් මහල්වල දත්ත පද්ධතියට හා ස්ථාපිත කර ඇති විදුලි පද්ධතියට හානිදායක තත්ත්වයක් ඇතිවීමේ අවදානම අදාල විදුලි සැපයුම් කොන්ත්‍රාත් සමාගම අමාත්‍යාංශයට දන්වා තිබුණි.

(v) ගොඩනැගිල්ලේ සැලැසුම් හා නිර්මාණ, මූලික ඉංජිනේරු කටයුතු වෙනුවෙන් රු.මිලියන 417.66 ක පිරිවැයක් දරා තිබූ අතර, එම සැලසුම් හා දොරවල් යතුරු යනාදිය උපදේශක ඉංජිනේරු ආයතනය විසින් නිසි පරිදි කොන්ත්‍රාත්කරුගෙන් භාරගෙන ගොඩනැගිල්ලේ වත්මන් නඩත්තු ඒකකය වෙත භාරදී නොතිබුණි.

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු කාර්යසාධන වාර්තාව සභාගත කර තිබුණේ 2018 ජුලි 17 දින දීය.

## 2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය ආධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 05 සඳහා එකතුව රු.මිලියන 600.62 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 238.00 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 362.62 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 60 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය මගින් වෙන්කල ප්‍රතිපාදන උපයෝජනය සඳහා ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් යුධ හමුදා මධ්‍යම පතොරම් ගබඩාව ඉදිකිරීම ව්‍යාපෘතිය හා ජාතික සයිබර් ආරක්ෂක පද්ධතිය ස්ථාපිත කිරීම් ව්‍යාපෘති කටයුතුවල ප්‍රතිපාදන උපයෝජනය පහළ මට්ටමක පැවැති අතර මානුෂවාදී සොයාබැලීම් හා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රමාදයන් හේතුවෙන් පිළිවෙලින් රු.මිලියන 175.19 ක්, රු.මිලියන 1.76 ක් හා රු.මිලියන 28.26 ක ප්‍රතිපාදන ඉතිරි වී පැවැතිණි.

(ආ) හැඳල රණවිරු සම්පත් කේන්ද්‍රයේ ඉදිකිරීම් කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසාදී නොතිබුණු නමුත් මුදල් රෙගුලාසි 66 යටතේ රු.මිලියන 13.12 ක් මාරු කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට මින් රු.මිලියන 9.82 ක් භාණ්ඩ මිලදී ගැනීම සඳහා වැයකල බව වාර්තා කර තිබුණ ද රු.මිලියන 7.36 ක් පමණක් ගිණුම් ගත කර තිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු.මිලියන 10,154.73 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 5,906.36 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

### 2.3.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම
-----------------------------------

ප්‍රසම්පාදන සැලැසුම් පිළියෙල කිරීමකින් තොරව රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘති සඳහා 2017 වර්ෂයේ රු.මිලියන 400 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 374.79 ක වියදම් දරා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය සඳහා වූ අතිරේක අංක 33 පරිදි වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව අනුමත අධිකාරී සීමාව ඉක්මවා අනුමැතිය ලබාදී තිබුණු අවස්ථා 03 ක් නිරීක්ෂණය විය.

### 2.3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම
------------------------------------------

**(අ) 2017 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාව වෙත අමු පොල් මිලදී ගැනීම**
-------------------------------------------------------------------

2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවේ කඳවුරු 92 ක්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ කඳවුරු 19 ක් හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කඳවුරු 25 ක් සඳහා වාර්ෂික අමු පොල් අවශ්‍යතාවය තීරණය කිරීමේදී හමුදා කඳවුරුවල පිහිටා තිබුණු පොල් වගාව සහිත ඉඩම් වලින් ලැබෙන පොල් අස්වැන්න පිළිබඳව සලකා බැලීමක් කර නොතිබුණි. කෙසේවුවද එම ප්‍රසම්පාදනයේදී පොල් කිලෝග්‍රෑම් එකක ගිවිසුම් ගත මිල රු.65 ක් ලෙස වැඩි කිරීම 2017 ජුනි 16 දින ආරක්ෂක අමාත්‍යාංශය ලේකම්වරයා විසින් තීරණය කිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට පොල් සඳහා ගිවිසුම් ගත මුදල ඉක්මවා රු.මිලියන 171.73 ක් ගෙවා තිබුණි. මේ මිල වැඩිකිරීම සඳහා 2017 වර්ෂයේදී 2018 වර්ෂය සඳහා ආහාර ප්‍රසම්පාදනය සඳහා වූ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා යුධ හමුදාවේ අවශ්‍යතාවන් සඳහා කළු උස සපත්තු ජෝඩු 75000 මිලදී ගැනීම**
--------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා යුධ හමුදාවට කළු උස සපත්තු ජෝඩු 75000 මිලදී ගැනීම සඳහා වූ අමාත්‍ය මණ්ඩලය පත්කල ප්‍රසම්පාදන කමිටුව විසින් 2016 වර්ෂයේදී ජාත්‍යන්තර තරඟකාරී පදනම මත ලංසු කැඳවා ලංසුකරුවන් ඉදිරිපත් කර තිබුණු නියැදි, පිරිවිතර වලට අනුකූල නොවීම හේතුවෙන් අවලංගු කර තිබුණි. නැවත 2017 වසරේදී ජාතික තරඟකාරී පදනම මත ලංසු කැඳවා ප්‍රසම්පාදන කමිටුව අනුමත කල දෙවන අවම මිල සඳහන් ලංසුකරු වෙනුවට අභියාචනා මණ්ඩලය තීරණය මත අවම මිල සඳහන් ලංසු කරුට රු.මිලියන 201.75 (වැට් රහිත මිල) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි.

(ii) ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ලංසු කැඳවීමෙන් පසු ලංසු ලේඛන වල ඇතුළත් වූ උපමාන ලංසුකරුවන්ට වාසිදායක ලෙසට ලිහිල් කර සංශෝධනය කර තිබීම, අවශ්‍ය සපත්තු ප්‍රමාණය අඛණ්ඩව ලබා ගැනීමට හැකිවන පරිදි සැපයුම්කරුගේ නිෂ්පාදන වාර්තා සහ නිෂ්පාදන ධාරිතාවය සඳහා ඇගයීම් නිර්නායක වල ප්‍රමුඛත්වයක් ලබාදී නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. මීට අමතරව, තෝරාගත් ලංසුකරු විසින් 2017 ජනවාරි 25 දින සිය සමාගම් ව්‍යවස්ථාවලිය සංශෝධනය කර තිබුණු අතර, ඒ අනුව 2017 ජනවාරි 25 දිනට පෙර මෙම සමාගම සපත්තු නිෂ්පාදනය හා ඊට අදාල වෙනත් කිසිදු කාර්යක් සඳහා සම්බන්ධවී නොතිබීම, අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද නියැදිය අදාල පරීක්ෂණයන්ගෙන් අසමත් වී තිබියදී නැවත පරීක්ෂාව සඳහා වෙනත් ආයතනයකට යොමු කර තිබීම හා අභියාචන වලදී ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණ මත තෝරාගත් ලංසුකරුට කරුණු දැක්වීමට සමාන අවස්ථාව ලැබී නොතිබීම යනාදී අඩුපාඩු නිරීක්ෂණය විය.

## (ඇ) ත්‍රිවිධ හමුදාවන් සඳහා ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනය

සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණු 2018 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාව වෙත ආහාර ද්‍රව්‍ය සැපයීම සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ 2018 වර්ෂය සඳහා ඉදිරිපත් වී තිබුණු ලංසු 10,083 කින් යුධ හමුදාවට අයත් ලංසු 148 ක්ද, ගුවන් හමුදාවට අයත් ලංසු 381 ක්ද හා නාවික හමුදාවට අයත් ලංසු 513 ක් වශයෙන් ලංසු 1,042 ක නියැදියක් පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2017 අප්‍රේල් 21 දින ආරම්භ කර තිබුණු නමුත් 2018 ජනවාරි සිට ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වී නොතිබුණි. 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ආහාර සැපයීම් ප්‍රදානය කල කොන්ත්‍රාත් අගය ක්‍රමයෙන් අඩු වී තිබුණද 2018 වර්ෂය සඳහා යෝජිත ප්‍රසම්පාදන කොන්ත්‍රාත් අගය ශ්‍රී ලංකා යුධ හමුදාවට රු.මිලියන 909 කින් හා නාවික හමුදාවට රු.මිලියන 1,401 කින් හා ගුවන් හමුදාවට රු.මිලියන 212 ක් වශයෙන් රු.මිලියන 2,522 කින් වැඩිවී තිබුණි.

(ii) තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා පත්කර තිබූ සමාජිකයන් දෙදෙනෙකුගේ පත්වීම් ගැටළු සහිත බව නිරීක්ෂණය වීම.

(iii) පරීක්ෂාකල නියැදියට අනුව සාධාරණ වෙළඳපොළ මිල තීරණය කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම ස්වාධින පිළිගත් නිශ්චිත පදනමක් මත සිදුවී නොතිබීම, එම මිල තාර්කික පදනමක් මත සකස් කර නොතිබීම, ලංසු ඇගයීමේ ක්‍රියාවලිය සඳහා සාධාරණ වෙළඳපොළ මිල තීරණය කිරීමේදී සලකා බැලිය යුතු වෙළඳපොළ නිර්ණායකයන් හා එම මිල ගණන් තීරණය කළ යුතු ක්‍රමවේදයන් නිශ්චිතව සකස් කර නොතිබීම, සාධාරණ වෙළඳපොල මිලක් පමණක් යොදා ගෙන මිල ගණන් සංසන්දනය කිරීම, තිරණය කල සාධාරණ වෙළඳපොළ මිලට වඩා අඩු මිල ගණන් අතාත්වික සේ සලකා ප්‍රතික්ෂේප කලද ඇතැම් අවස්ථාවල නැවත සලකා බලා තිබීම, ලංසුකරුවන් විසින් නිශ්චිතව කදවුර සඳහන් නොකිරීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රධාන බැහැර වීමක් ලෙස සලකා ලංසු ප්‍රතික්ෂේපිත කිරීම ආදී හේතුවෙන් එකතුව රු.මිලියන 69.14 ක අවාසිදායක මූල්‍ය බලපෑමක් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(iv) ශීතකළ ආහාර හා මස්, මාළු ආදි ඉක්මනින් නශ්‍ය වන ආහාර සැපයුම් ප්‍රසම්පාදන ඇගයීමේදී පරස්පරතා ඇතිවී තිබූ බව නිරීක්ෂණය වූ අතර ගබඩා, ශීතාගාර පහසුකම් පරීක්ෂාව සඳහා තෝරාගත් ක්‍රමවේදය විගණනයේදී පැහැදිළි නොවුණි.

(v) ලංසුකරුට එරෙහිව ඇති පූර්ව සැපයුම් පිළිබඳ අයහපත් වාර්තාවන් ඇත්නම් ඒ මත ලංසුකරුගේ සියළුම ලංසු හෝ එක් ලංසුවක් හෝ වැඩි ප්‍රමාණයක් ඇගයීම් ක්‍රියාවලියේදී ප්‍රතික්ෂේප කරන බව සඳහන්ව තිබියදී ලංසු ඇගයීමේදී සාරානුකූල සැපයුම්කරුවන්ගේ එම වාර්තා සැලකිල්ලට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## (ඈ) ආරක්ෂක සේවා විද්‍යාලය සඳහා ලී බඩු මිලදී ගැනීම

කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලය සඳහා රු.මිලියන 9.43 ක ලී බඩු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීමකින් තොරව මිලදී ගෙන තිබුණු අතර 5.3.13 වගන්තිය අනුව ඇගයීම් ක්‍රියාවලියේදී ප්‍රධාන බැහැරවීමක් වූ ලංසු ඇපකරයේ අඩුපාඩු සුළු බැහැරවීම් සේ සලකා කටයුතු කර තිබුණි.

**2.4** **වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 වන වගන්තිය පරිදි අපහරණය/ විකිණීම ලෙස වාර්තා කරන ලද රු.මිලියන 3.16 ක වටිනාකමට අදාළ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොවූයෙන් එම අගයන්ගේ නිරවද්‍යතාවය පරීක්ෂා කළ නොහැකි විය.

**(ආ)** **වත්කම් ලේඛනගත කිරීම**

**---------------------------**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය හා මුදල් රෙගුලාසි 1647 ප්‍රකාරව වාහන ලැයිස්තු පවත්වා ගෙන යාමට අදාලව 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ වූ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් කැඳවා තිබුණු වත්කම් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ)** **වාහන උපයෝජනය**

**-----------------------**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 86 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 1,188,243 ක් ධාවනය කර තිබුණු අතර, ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.මිලියන 13.97 ක්ද, වාහන සේවා කිරීම සඳහා රු.මිලියන 2.58 ක්ද, වාහන අළුත්වැඩියා සඳහා රු.මිලියන 16.09 ක්ද හා වාහන ප්‍රවාහන සේවා (රක්ෂණ) සඳහා රු.මිලියන 2.95 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 35.59 ක් වැය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු. 29.96 ක් වැය කර තිබුණි.

**(ඈ)** **මූල්‍ය හා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය**

**---------------------------------------------------------------------------**

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන තිබුණු වටිනාකම රු.මිලියන 35.90 ක විශේෂිත පහසුකම් සහිත සුඛෝපභෝගී බස්රථ 02 ක් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2016 ජුනි 08 දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා දී තිබූ අතර එම බස් රථ 2016 ජුලි 14 දින ශ්‍රී ලංකා යුධ හමුදාවට හා ශ්‍රී ලංකා නාවික හමුදාවට ලබා දී තිබුණි. සුඛෝපභෝගි බස්රථ දෙක සඳහා රු.මිලියන 7.75 ක් වූ ආපසු ගෙවියයුතු කල් බදු ණය මුදල හා රු.මිලියන 0.49 ක් වූ කල්බදු පොළිය බැදිම් ලෙස හෙළිදරව් කර නොතිබුණි.

**(ඉ)** **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති 02 ක හා ආයතන 02 කින් සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ජාතික ශිෂ්‍යභට බලකා පුහුණු මධ්‍යස්ථානයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රණ්ටැඹේ අව් ගබඩාවේ ගිනිඅවි 1,638 ක් නිවැරදිව ලේඛන ගත කර නොමැති වීම හා භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවැති නාවික, ගුවන්, පොලිස් නිල ඇඳුම් ආයිත්තම් 17,250 ක් දීර්ඝ කාලයක් තිස්සේ පැවැතිණි. තවද බලකා මූලස්ථානය ඇතුළු ස්ථාන 13 ක භාණ්ඩ වට්ටෝරු ලෙජරය නිසි පරිදි යාවත්කාලීන නොකළ අවස්ථා නිරීක්ෂණය විය.

**(ඊ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

උපාය මාර්ගික සන්නිවේදන ජාල ව්‍යාපෘතියට අදාලව 2016 වර්ෂයේදී රු.මිලියන 15.69 කට මිලදී ගෙන සවිකර තිබුණු විදුලි ජනක යන්ත්‍ර 10 ක් හා රු.මිලියන 18.80 කට මිලදී ගෙන තිබුණු කුටි ඉදිකිරීම අවසන් නොකළ විදුලි ජනක යන්ත්‍ර 12 ක් සම්ප්‍රේශන මධ්‍යස්ථානවල 2017 දෙසැම්බර් 31 දින වන විට නිෂ්ක්‍රීයව පැවතුණි.

## 2.5 බැදීම් හා බැරකම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය**

(i) විසර්ජන ගිණුමේ බැරකම් ප්‍රකාශය පෙන්නුම් කර තිබුණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන 05 කට අදාල බැරකම් වටිනාකම් හා අදාල ආයතන මගින් ඉදිරිපත් කර තිබුණු බැරකම් වටිනාකම් අතර රු.මිලියන 6.62 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ii) ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් සංකීර්ණ ව්‍යාපෘතියට අදාලව 2016 හා 2017 වර්ෂ වලදී කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු විසින් ඉල්ලුම් කර තිබුණු කාලය දීර්ඝ කිරීමේ හිමිකම්පෑම් 12 ක් මත රු.මිලියන 486.64 ක අතිරේක මුදල සමාලෝචිත වර්ෂයේදී බැදීම් යටතේ ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) අනුමත සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීම**

මුදල් රෙගුලාසි 94 විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී ඉතිරිවී ඇති ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 9.79 ක බැරකම් සඳහා එකඟ වී තිබුණි.

## 2.6 පාඩු හා හානි

විසර්ජන ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ පිරිවැයට ඇතුළත් වූ ගොඩනැගිලි පරිශ්‍රය තුළ 2014 පෙබරවාරි 11 දින සිදු වූ ගිනි හානියෙන් සිදුවී තිබුණ රු.මිලියන 12.31 පාඩුව සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට වාර්තා කර නොතිබුණි.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

2016 ජූලි 22 ,23 හා 24 සහ 2016 අගෝස්තු 10 දිනයන්හි පැවති රජයේ ගිණුම් කාරක සභා උපදෙස් මත ත්‍රිවිධ හමුදාව විසින් බාහිර පාර්ශවයන් සඳහා සපයන සේවාවන් මගින් උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සම්බන්ධව නිශ්චිත ක්‍රමවේදයක් සකස් කලයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් එවැනි ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

## 2.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| 2013 | පුනරාවර්තන | 10,867 | 9,170 | 1,697 | 16 |
| | මූලධන | 18,725 | 12,507 | 6,218 | 33 |
| | **එකතුව** | **29,592** | **21,677** | **7,915** | **27** |
| 2014 | පුනරාවර්තන | 5,354 | 5,314 | 40 | 1 |
| | මූලධන | 20,273 | 14,202 | 6,071 | 30 |
| | **එකතුව** | **25,627** | **19,516** | **6,111** | **24** |
| 2015 | පුනරාවර්තන | 5,677 | 5,364 | 313 | 6 |
| | මූලධන | 13,820 | 9,113 | 4,707 | 34 |
| | **එකතුව** | **19,497** | **14,477** | **5,020** | **26** |
| 2016 | පුනරාවර්තන | 5,936 | 5,694 | 242 | 4 |
| | මූලධන | 11,551 | 7,458 | 4,093 | 35 |
| | **එකතුව** | **17,487** | **13,152** | **4,335** | **25** |
| 2017 | පුනරාවර්තන | 12,273 | 8,993 | 3,280 | 27 |
| | මූලධන | 9,822 | 7,258 | 2,564 | 26 |
| | **එකතුව** | **22,095** | **16,251** | **5,844** | **26** |

**විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 61.52 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි. තවද වැය විෂයයන් 27 කට මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකර ගන්නා ලද ප්‍රතිපාදන වලින් රු.මිලියන 389.48 ක් ද උපයෝජනය කර නොතිබුණි.

### (ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම

වැය විෂයයන් 79 ක් සඳහා එකතුව රු.මිලියන 5,428.79 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 4,983 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඇ) මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් උපයෝජනය කරගෙන නොතිබීම**

**---------------------------------------------------------------------------**

මුදල් රෙගුලාසි 66 පරිදි ප්‍රතිපාදන වෙනත් වැය විෂයකට මාරු කර පසුවත් ප්‍රමාණාත්මක ප්‍රතිපාදන ඉතිරිවීම් වැය විෂයන් 14 සඳහා රු.මිලියන 2,159.61 ක ප්‍රමාණයක් පැවතුණු බව නිරීක්ෂණය විය.

**(ඈ) නව ව්‍යාපෘති යෝජනා සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම**

---------------------------------------------------------------

මුදල් රෙගුලාසි 230 පරිදි සංකේත ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව නව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 මාරු කිරීම හා අතිරේක ප්‍රතිපාදන මඟින් රු.මිලියන 206 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ දී ඉන් රු.මිලියන 125.42 ක් පමණක් වැය කර තිබුණි.

**(ඉ) වෙනත් අමාත්‍යාංශ විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

**------------------------------------------------------------------**

අධ්‍යාපන අමාත්‍යාංශයේ රු.මිලියන 30 ක ප්‍රතිපාදනයෙන් කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයේ සූර්ය බල පද්ධතියක් ස්ථාපනය කරගැනීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් 2016 අගෝස්තු 03 දින ලබාගත් ශක්‍යතා අධ්‍යනයක් අනුව පද්ධතිය ස්ථාපිත කිරීමට 2016 ඔක්තෝබර් 11 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රසම්පාදන කටයුතු ආරම්භක අදියරේ පැවැතුණි.

**2.9 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**-----------------------------------------**

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 10.03.07.05 සඳහා රු.මිලියන 21 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 29 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 138 ක් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හිඟ හිටි ආදායම එකතුව රු.මිලියන 1.50 ක් වූ අතර එය වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් අතර කාල පරාසයකට අදාළ විය. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවති අතර, අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 1996 අංක 22 දරන ගිනිඅවි (සංශෝධිත) පනත යටතේ අයකරනු ලබන ගාස්තු සංශෝධනය සඳහා අමාත්‍යවරයා වෙත බලය පැවැරෙන පරිදි පනතේ විධිවිධාන සංශෝධනයට අදාල කාර්යයභාරය සමාලෝචිත වර්ෂය තුලදී නිම වී නොතිබුණි.

(iii) සිවිල් ආරක්ෂක අංශය හා දිස්ත්‍රික්කවල ඇති සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලන කාර්යාලවල පිළිවෙලින් බලපත්‍ර නිකුත් කිරීම හා භාවිතය පිළිබඳව කාර්යයයන් 22 කට අදාලව හා පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධව අනුමත කල, නිකුත් කල දත්ත ඇතුලත් පරිගණක තොරතුරු පද්ධති පවත්වා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය දක්වා කටයුතු කර නොතිබුණි.

## 2.10 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 10301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා සත්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | සත්‍ය | අවම සීමාව | සත්‍ය | උපරිම සීමාව | සත්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 85.00 | 84.89 | 45.00 | 46.66 | 275.00 | 173.74 |

හිඟහිටි ශේෂ අයකර ගැනීම

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.මිලියන 4.68 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 0 ක සිට වර්ෂ 26 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 2.11 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 236.37 ක් වූ අතර, අංක 6000/0000/00/0016/0063/000 දරන පොදු තැන්පතු ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය තුළ ඇතුළත් වර්ෂ 2 ක ඉක්මවූ රු.මිලියන 2.30 ක තැන්පතු 08 ක් සඳහා මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.12 බැංකු ගිණුම් මෙහෙයවීම

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු බැංකු ගිණුම් දෙකක 2017 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු එකතුව රු.මිලියන 1.02 ක චෙක්පත්වලින් මාස 06 ඉක්මවූ රු.මිලියන 0.56 ක චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.13 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබූ බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ආ) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |

## 2.14 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 219.78 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.633,387 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 63 | 51 | 12 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 04 | 06 |
| (iii) | ද්විතියික මට්ටම | 252 | 167 | 85 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 155 | 121 | 34 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 04 | - |
| | එකතුව | 484 | 347 | 137 |

නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරු 01 ක් හා අතිරේක නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරු 02 ක පුරප්පාඩු 2012 වර්ෂයේ සිටම පිරවීමට අපොහොසත් වී තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව සන්නද්ධ හමුදාවල සාමාජිකයන් පහත පරිදි අමාත්‍යාංශ රාජකාරි සඳහා අනුයුක්ත කර තිබුණි.

| හමුදාව | නිලධාරීන් | සෙසු නිළ | එකතුව |
|---|---|---|---|
| යුද්ධ හමුදාව | 62 | 146 | 208 |
| නාවික හමුදාව | 6 | 47 | 53 |
| ගුවන් හමුදාව | 9 | 44 | 53 |
| මුළු එකතුව | 77 | 237 | 314 |

අමාත්‍යාංශයේ විවිධ අංශවල රාජ්‍ය කළමනාකරණ සේවයේ තනතුරු 41 ක නිළඇඳුම් කාර්යය මණ්ඩලය විසින් රාජකාරි කටයුතු ඉටු කරමින් පැවැතිණි.

## 2.15 රජයේ නිලධාරීන් ඇප තැබීම

රජයේ මුදල් සම්බන්ධව සහ ගබඩා භාරව කටයුතු කරන නිළධාරීන් 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට හා මුදල් රෙගුලාසි 880 අනුකූලව ඇප තැබිය යුතු වුවද අමාත්‍යාංශයේ නිලධාරීන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඇප තබා නොතිබුණි.